## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2017

--------------------------------------------

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ 25(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් සමග ඉදිරිපත් කර තිබූ සටහන් අංක 2.1.(අ) ප්‍රකාරව, ආයතනයේ ගිණුම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර ඇති බව දක්වා තිබුණි. එහෙත්, එම ගිණුම්කරණ ප්‍රමිතිවල පළමු ඡේදයෙහි 1 කොටස අනුව භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර මෙම ප්‍රමිති අනුගමනය නොකළ යුතු බව සහ 1.2 ඡේදයෙහි (අ) කොටස අනුව ප්‍රසිද්ධ ගිණුම් කටයුතුභාවය (Public Accountability) සහිත ආයතනද මෙම ගිණුම්කරණ ප්‍රමිති ගිණුම් සකස් කිරීමට යොදා නොගත යුතු බව දක්වා තිබුණි. එහෙත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් ඊට අනුකූල නොවන ලෙස එම ගිණුම් ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර මේ පිළිබඳ ඉකුත් වර්ෂ වල විගණනයන් මගින්ද පෙන්වා දී තිබූ නමුත් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල පරිච්ඡේද 18 හි 24 වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.4,798,955 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 සැප්තැම්බර් 18 දින තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ආයතනයට පවරා දී තිබූ හෙක්ටයාර් 0.1012 ක (පර්චස් 40 ක් පමණ) ඉඩමේ වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාල උපචිත වියදම් රු.177,880 ක් 2017 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු.228,955 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

වටිනාකම රු.1,627,809 ක උපචිත වියදම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණය සහිත විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ දැක්වෙන රු.11,783,512 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ තුල ඇතුලත් 2017 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු පාඨමාලා ගාස්තු රු.11,216,274 ක් විය. එයින් වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.101,250 ක් වූ ණයගැති ශේෂ 25 ක් ද, වර්ෂ 03 ත් වර්ෂ 05 ත් අතර එකතුව රු.3,139,225 ක් වූ ණයගැති ශේෂ 504 ක් ද, වර්ෂ 01 ත් වර්ෂ 02 ත් අතර එකතුව රු.2,797,025 ක් වූ ණයගැති ශේෂ 256 ක් ද වූ අතර එම ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) VIII වැනි පරිච්ඡේදයේ 2.1 ඡේදය | ආයතනයේ අතිකාල වැඩ පැවරීම, අධීක්ෂණය සඳහා විධිමත් පාලන ක්‍රමවේදයක් කළමනාකරණය විසින් හඳුන්වා දී නොතිබුණි. |
| (ii) VIII වැනි පරිච්ඡේදයේ 7.1 හා 7.2 ඡේද | නිලධාරීන් සඳහා මාසිකව අනුමත අතිකාල පැය ගණන ඉක්මවා අතිකාල ගෙවීමට සිදුවන විට ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු සඳහා අවස්ථා 22 කදී රු. 154,971 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (iii) XII වැනි පරිච්ඡේදයේ 1.7 ඡේදය | නිලධාරීන්ගේ අනුමත කරන ලද නිවාඩු සටහන් කිරීම සඳහා 190 පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව නිවාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

(iv) XXIV වැනි පරිච්ඡේදයේ 10.2 ඡේදය

ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවන ආයතනයේ සභාපති හා තාවකාලික පදනම මත සේවයට අනුයුක්ත කර තිබූ සේවකයකු සඳහා ආපදා ණය ලෙස රු. 329,167 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

-----------------------------------------------

(i). මුදල් රෙගුලාසි 137 හා 138

මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි වවුචර් අනුමත කිරීම හා සහතික කිරීමකින් තොරව අවස්ථා 09 කදී එකතුව රු.137,981 ක් ගෙවීම් කර තිබුණි.

(ii). මුදල් රෙගුලාසි 396 (ඇ)

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ එකතුව රු. 9,850 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii). මුදල් රෙගුලාසි 454 (I)

ආයතනයේ භාවිතා කරන ඉන්වෙන්ට්‍රි බඩු පිළිබඳ වාර්තා ඇතුළත් බඩු ලේඛන පොතක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(iv). මුදල් රෙගුලාසි 751

තොග ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත

-----------------------------------------------

(i). පනතේ 14 (i) වගන්තිය

සෑම මාසයකදීම එක්වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පමණක් පවත්වා තිබූ අතර එම රැස්වීම් වලදී ද ආයතනයේ මෙහෙයුම් කටයුතු වර්ධනය කර ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ii). පනතේ 23 හා 24 වගන්ති

(අ) පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ රු.1,603,996 ක් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජන කර තිබූ රු.5,598,019 ක් ඉවත් කර තිබුණි.

| | | |
|---|---|---|
| | | (ආ) සමාලෝචිත වර්ෂය තුලදී රු. 8,605,090 ක් කෙටිකාලීන ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබූ අතර, ව්‍යවස්ථාපිත පනතේ III වන කොටසේ 23 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව හා 2012 ජුනි 29 දිනැති යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පරිදි අමාත්‍යවරයාගේ නිර්දේශය අනුව වර්ෂය තුළ කරන ලද ඉහත ආයෝජන සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,896,260 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 7,628,442 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,267,818 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව කාර්ය මණ්ඩල වියදම් හා වෙනත් මෙහෙයුම් වියදම් රු. 1,619,693 කින් වැඩි වුවද පාඨමාලා ආදායම සහ පොලී ආදායම් රු. 3,276,157 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ අතිරික්තය අඩුවීමක් පැවතියද 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අතිරික්තයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.12,488,771 ක් වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂය වන විට රු. 10,961,081 ක් දක්වා අඩු වී තිබුණද ඉන්පසු වර්ෂවලදී අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.16,607,841 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු. 8,896,260 ක අතිරික්තයක් ඇති වී තිබුණද ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු වලින් ලබා තිබූ අතිරික්තය රු.1,696,420 ක් හෙවත් මුළු අතිරික්තයෙන් සියයට 19 ක් පමණක් වූ අතර ආයෝජන පොලී මගින් රු. 7,199,840 ක් හෙවත් සියයට 81 ක් උපයාගෙන තිබුණි. තවද 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු වලින් ලද අතිරික්තය රු.756,143 කින් එනම් සියයට 31 කින් අඩුවී තිබුණි.

(ආ) වර්ෂය තුළ පුහුණුව සඳහා බඳවාගත් ආධුනික සංඛ්‍යාව 182 කින් වැඩිවීම හා පාඨමාලා ගාස්තු රු.500 සිට රු.1,000 දක්වා වූ පරාසයකින් වැඩි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික පාඨමාලා ගාස්තු ආදායම රු.1,253,696 කින් වැඩි වී තිබුණි.

(ඇ) ආයතනයට අනුබද්ධිත එකම ශාඛාව මාතලේ පිහිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ එහි මෙහෙයුම් කටයුතු වලින් රු.143,057 ක ඌනතාවයක් ලබාතිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු. 225,530 ක් හෙවත් සියයට 273 ක් විය. ආයතනය විසින් මෙම ශාඛාවේ මෙහෙයුම් කටයුතු වර්ධනය කර ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යයසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 – 2016 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයට ගැළපෙන පරිදි යාවත්කාලීන කර නොතිබුණි. තවද උක්ත සංයුක්ත සැලැස්මේ ඇතුළත් නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම, විදේශ සේවා නියුක්තිය සඳහා ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම්වලින් හා බහු හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම, ආයතනය සඳහා නව සංවිධාන සැලැස්මක් ස්ථාපිත කිරීම හා ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ලබා ගැනීම යන කාර්යයන් විගණන අවස්ථාව වූ 2018 අප්‍රේල් 11 දින වනවිටත් ඉටුකර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන සකස්කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, පාඨමාලා 16 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා, ඇස්තමේන්තුකරණය සහ පෙර මුද්‍රණ ක්‍රියාකරු යන පාඨමාලා තුන සමාලෝචිත වර්ෂය තුල පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්ෂේත්‍ර 03 ක් යටතේ පාඨමාලා 13 ක් පැවැත්වීම සඳහා ආධුනිකයින් 1084 දෙනෙකු බඳවාගෙන තිබූ අතර සමස්ත බඳවා ගැනීම් වලින් සියයට 58 ක් නිර්මාණ සැලසුම් හා මාධ්‍ය ක්ෂේත්‍රය ( Art Design & Media) සඳහා වූ පාඨමාලා පමණක් විය.

(ඇ) 1984 අංක 18 දරන මුද්‍රණ ආයතන පනත අනුව, ආයතනයේ ප්‍රධානතම මෙහෙයුම් කටයුත්ත පාඨමාලා පැවැත්වීම වන අතර සමාලෝචිත වර්ෂයේදී එම කටයුතු මගින් ආයතනය ලබා දී තිබූ ශුද්ධ දායකත්වය සියයට 19 ක පමණ අවම මට්ටමක වූයෙන් පාඨමාලා ආදායම් වැඩිකර ගැනීම සඳහා නව පාඨමාලා හඳුන්වා දීම, නව ශාඛා ආරම්භ කිරීම හා පවතින ශාඛාවේ ආදායම් වැඩිකර ගැනීම වැනි මෙහෙයුම් කටයුතු පුළුල් කර ගැනීමේ වැඩපිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2016 හා 2017 වර්ෂ තුල ආරම්භ කර තිබූ පාඨමාලා 07 ක ආධුනික හැරයාම් 99 ක් සමාලෝචිත වර්ෂය තුලදී සිදු වී තිබූ අතර පාඨමාලා හැරයාම් 38 ක වැඩිම ප්‍රමාණය පරිගණක චිත්‍රක ඩිප්ලෝමා පාඨමාලාවෙන් සිදු වී තිබුණි. කෙසේ වුවද, පාඨමාලා හැරයාම් වලට අදාල හේතූන් පරීක්‍ෂාකර ඒවා අවම කිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය අවම මට්ටමක පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබූ පාඨමාලා 16 අතුරින් පරිගණක චිත්‍රක හා පාසැල් හැරයන්නන් සඳහා ඕෆ්සෙට් ලිතොකරණ පාඨමාලා 02 ක පමණක් ජාතික නිපුණතා සම්මත මට්ටම සඳහා ප්‍රතීතනය කර පවත්වා තිබූ අතර අනෙකුත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත සහතික පත්‍ර පාඨමාලාවක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. කෙසේ වුවද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව, 2014 සිට 2017 දක්වා වර්ෂ 04 ක් තුළ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ආධුනිකයන් වෙත නිකුත්කර තිබූ සහතික පත්‍ර සංඛ්‍යාව 08 ක් පමණක් වී තිබුණි. මේ නිසා එම පාඨමාලා දෙකද කාර්යක්ෂම අයුරින් ජාතික නිපුණතා සම්මත සහතික පත්‍ර ලබාදීම සඳහා ක්‍රියාත්මක නොකරන බව නිරීක්ෂණය විය.

(ඊ) 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පවත්වා තිබූ විවිධ පාඨමාලා 18 කට අයත් සහතික පත්‍ර (NVQ නොවන) 1,401 ක් විගණන දිනය වූ 2018 අප්‍රේල් 11 දින වන විටත් ආධුනිකයන්හට ප්‍රදානය නොකර ආයතනය තුල තබාගෙන තිබුණි. එයින් සහතිකපත් 442 ක්ම ග්‍රැෆික් ඩිසයින් පාඨමාලාව හැදෑරූ ආධුනිකයන්ට ප්‍රදානය කළ යුතු සහතික පත්‍ර විය.

(උ) මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබූ ආධුනිකයින් 09 දෙනෙකුගෙන් අයවිය යුතු පාඨමාලා ගාස්තු රු.440,000 ක් හා දෘෂ්‍ය සන්නිවේදනය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබූ ආධුනිකයන් දෙදෙනෙකුගේ පාඨමාලා ගාස්තු රු. 92,500 ක් පාඨමාලා සම්පූර්ණ කිරීමට ප්‍රථම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොමැතිව හා කිසිදු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල ආයතනය පවත්වාගෙන යාමට ඉඩ පහසුකම් සලසා දී තිබූ අතර ඊට අවශ්‍ය විදුලිය හා ජලය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සීමාවකින් තොරව සපයනු ලැබේ. තවද, කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු

කිරීම මෙම මුද්‍රණ ආයතනය විසින් සිදු කර තිබූ නමුත් ඉහත තත්ත්වයන් මූලා ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් උපයනු ලබන ආදායමින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.78,647,481 ක් ස්ථිර තැන්පතු වල ආයෝජනය කර තිබූ අතර ආයතනයේ මෙහෙයුම් කටයුතු පුළුල් කර අරමුණු ලගා කර ගැනිම සඳහා එම අරමුදල් යෙදවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සහතික පත්‍ර භාර ගැනීම, තබා ගැනීම හා නිකුත්කිරීම සඳහා වන රාජකාරි ලිඛිතව පැවරීමකින් තොරව කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන තිබූ නිලධාරියෙකු විසින් සිදුකර තිබූ අතර මුද්‍රණය කර තිබූ සහතික පත්‍ර මෙන්ම නිකුත් කල හා නොකල සහතික පත්‍ර සම්බන්ධ වාර්තා ආයතනය විසින් පවත්වා නොතිබුණි.

(ආ) සහතික පත්‍ර මුද්‍රණය කිරීමට හා නිවැරදිභාවය තහවුරු කර සහතික අත්සන් කිරීමට විධිමත් ක්‍රමවේදයක් ආයතනය සතුව නොතිබුණි. මේ හේතුවෙන් අවස්ථා 04 කදී එකම නමට සහතික පත්‍ර දෙක බැගින් මුද්‍රණය කර එම සහතික පත්‍රවල ආයතනයේ ඉහළ නිලධාරියෙකු විසින් අත්සන් තබා තිබුණි.

(ඇ) මුද්‍රණය කර තිබූ හිස් සහතික පත්‍ර 1084 ක් ආයතනයේ වගකිව යුතු නිළධාරියකු භාරයේ ආරක්ෂිතව ගබඩා කර පවත්වාගෙන නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිලධාරීන් සඳහා කිසිදු දීමනාවක් ගෙවිය නොහැකි වුවද ආයතනය මගින් පවත්වා තිබූ දැ අවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලා ආදායමින් රු.85,000 ක් සභාපතිවරයා වෙත ගෞරව හා ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) මාසික ස්ථිර වැටුපක් හා ඉන්ධන දීමනා මත ආයතනයේ වෙළඳ සහායක ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරියෙකු වෙත තනතුරට අදාල රාජකාරි කටයුත්තකට පොලොන්නරුව දිස්ත්‍රික් තරුණ කඳවුර සඳහා සහභාගි වීම වෙනුවෙන් දින දෙකක් සඳහා සංයුක්ත දීමනා ලෙස රු.10,000 ක් හා කාමර කුලී රු.6,000 ක් ගෙවා තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 13 දෙනෙකු සහ තත්‍ය කාර්ය මණ්ඩලය 11 ක් වූ අතර ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර හා වෙළඳ සහයක තනතුර සඳහා ස්ථිර සේවක පදනම මත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් උපදේශක තනතුරු 02 ක් පුරප්පාඩුව පැවති අතර පාඨමාලා පවත්වාගෙන යාම සඳහා බාහිර කථිකාචාර්යවරුන් 29 දෙනෙකුගේ සහ උපදේශකවරු 06 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, ආයතනය තුළ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ හේතුවෙන් ආයතනයේ කටයුතු කාර්යක්ෂමව, ඵලදායීව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කරන බව තහවුරුකර ගැනීමට ක්‍රමවේදයක් ආයතනය සතු නොවුණි.

### 6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී සියයට 10 සිට සියයට 453 දක්වා විචලනයන් සිදුව තිබූ අවස්ථා 40 ක් හා අයවැය මගින් මුදල් වෙන්කර ගැනීමකින් තොරව අවස්ථා 11 කදී රු.1,233,489 ක වියදම් දරා තිබීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී රු.56,725 ක් වැය කර ආයතනය සඳහා ආයතන කාර්යය පරිපාටියක් හා මුල්‍ය කාර්යය පරිපාටියක් පිළියෙල කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි. එහෙත් ඒ පිළිබඳ කිසිදු පසුවිපරමක් ආයතනය විසින් සිදු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

(ආ) 2016 හා 2017 යන වර්ෂවල ආයතනය විසින් ආධුනිකයන්ගෙන් අය කරන පාඨමාලා ගාස්තු ඉහළ දමා තිබුණද ඒ සඳහා පදනම් කර ගන්නා නිර්ණායක ඇතුළත් විධිමත් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ආදායම් පාලනය | පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා පිළිගත් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබීම. |
| (ආ) ණයගැති පාලනය | බොල්ණය වෙන් කිරීමේ විධිමත් ක්‍රම වේදයක් නොතිබීම හා ණය අයකර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ඇ) සහතික නිකුත් කිරීම | සහතික මුද්‍රණය කිරීම, තබා ගැනීම හා නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී නොතිබීම. |